දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අ.පො.ස උසස් පෙළ විභාගය 2018 - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

| සිංහල I | 71 S I | පැය තුනයි |
|---|---|---|

පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1' පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා , ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදාගන්න)

(අ එවේලෙහි දී රන් දෙයක් සපා දූක සේ ලෙන පරිද්දෙන් කිසිවක් කන්ට ආලයෙක් ඇතැ'යි කිවුය. 'කුමකට දැ'යි විචාළ කල්හි පිත හා උතුන් ගෙන කබලුපුවකට යයි නැකත් වෙලකින් කෙසිවිදුව මහත් දෙයක් කෙසිවිදැයින් අදහා කලක් පරිද්දෙන් දූක සේ කියාපිය.සිටාණන්ගේ අදහස පටුවූවත් තමන්ගේ අදහස විශාරද හෙයින්,'ඇයි මෙතරම් කියන්ට මැළි වූයේ අලුකෙළක් වස්තු ඇතිවත් දුක්පත් හෙයින්ද? සියලුමගේ සක්ඛය නම් නියම්ගම ඇත්තවුන්ට සෑහෙන ලෙස කබලු පිසෙම් ද? එතෙක් කල් උන් ළඟ වැසත් උන්ගේ අදහස සිතට නොනැංගා සේ විචාළෝ ය. ඒ අසා සිටාණෝ 'උන් අපට හැයිද? උං රුචි ඇත්තවු නම් තම තමන්ගෙන් කතී' කිවුය.'එසේ වී නම් මේ නියම්ගම එක් වීථියක ඇත්තවුන්ට සෑහෙන ලෙස පිසෙම්ද?' යි කිවුය.'හැයි තොප මා ඇතුන් නියාව අපි දන්නමෝ වේදැ'යි කියා එටත් මැළි වූය. එසේ වී නම් මේ ගෑහිනාට ඇතුළත වසන්නවුන්ට සෑහෙන ලෙස පිසෙම් ද? යි කිවුය. උන් තමන්ගේ අදහස් ලෙසින් විචාරන්නා 'තොපගේ අදහස් විශාරද නියාව අදි නොහැඟුණත් දැනුත් නොහැකිද? එසේත් නොසෑමැන්නේ ය'
යි කිවුය. එසේ වී නම් මුඹගේ අඹුදරුවන්ට පමණක් සෑහෙන ලෙස පිසෙම් ද'යි කිවු ය.

I' සිටුතුමා විසින් තමන්ට කිසිවක් කෑමේ කැමැත්ත ඇති බව පැවසූ ආකාරය කතුහිමියන් පෙන්වන්නේ කෙසේද?

II' සිටු දේවියගේ අදහස් කෙබඳු ආකාරයෙන් වීද?

III' සිටු දේවිය විසින් දෙවනවර කබලු පිසන්නෙමු යැයි පවසන්නේ කවුරුන් උදෙසාද?

IV' "කෙසිවිදුට මහත් දෙයක් කෙසිවිදැයින් අදහා කලක් පරිද්දෙන් " යන්න සරල බසින් ලියන්න.

(ආ) සාතා ගොවියාගේ සාලි නම් ගොනෙක් සිවැල පය ඇනී යා නොයී එතැන ම වැටිණ. ඒ සාතා ගොවියා රජනට අවා බියෙන්ගෙන් මේ ගොනා සිවැලින් මිදුනා ලදුව පය බිඳී යම් සේ යා නොහී වැදහොවී ද එපරිද්දෙන් මේ පැස්වාල රජ ද යුද්ධයෙහි සතුරන් විසින් පරදවන ලද්දේ අඩයවියෙන් ඇමතී මේ



www.artsapi.lk

Scanned by CamScanner

ගොනා මෙන් අනාථ අසරණව වේදනාත්මකව මරණ බිමෙහි වැටී වැදහොවවයි කියා මෙපරිද්දෙන් ඇඬුවේ ය. ඉක්බිති පුරෝහිත බමුණු කියනුයේ කෘසිවලය තෝ ඉතා අඥානයෙහිය.සියානා වූ තොපම ගොනා පය සිවැලින් ඇත පය බිඳ කියි අපරාධයක් නැති නිර්දෝෂී රජ හට අවන්නෙහිය. එබැවින් තෝ ඉතා අධර්මිෂ්ඨ එකෙකැයි කීය. එවේලෙහි ගොවියා කියනුයේ එම්බල පින්වත් වූ බ්‍රාහ්මණයා ප්‍රජාව රැකීමෙහි නිරාභිලාෂී වූ අධර්මයෙන් බදු පඩුරු ගෙන සත්වයන් පෙළෙන්නා වූ රාජ චෝර භයින් පීඩිතව මඳ වැසිල්ලක් නොලබන දනව්වාසීන් ඇත මේ රජහට දෙවුවයි තොපි මට කනස්සලු තොව මාගේ වචනය ඇසූ පමණක් විනා අවශේෂ සත්ත්වයන් කියන ආක්‍රෝශ පරිභව නොඇසුවා. බොහෝ සත්ත්වයෝ මෙපරිද්දෙන් පසුවාල රජහට පරිභව බෙණෙති.

I ගවයාට සිදු වී ඇති විපත කුමක්ද?

II ගොවියා අධර්මිෂ්ඨ කෙනෙකු යැයි පුරෝහිතයා පවසන්නේ ඇයි ?

III ජනතාව පීඩාවට පත් වන්නේ කුමන හේතු නිසාද?

IV " කෘසිවලය ,නිරාභිලාෂී" යන පදවල සරල අදහස් ලියන්න.

(ඉ). ඔහුගේ බස් අසා ගම්වැසි මනුෂ්‍යයෝ භයින් තැති ගෙන ගෙවල දොර අගුළු ලාගෙන ඒ ඒ තැන්හි සැඟවී ගියහ.එකල ඒ සොරා ඒ රාත්‍රී භාගයෙහි තමා පිට තබා බැඳි මළමිනිය උනාගත නොහී ඒ මිනිය පිට බැඳි වනම ඇරගෙන තමා වසන ගෙදොරට ඇවිත් භාර්යාවට කියනුයේ " එම්බල සොඳුරි දොර හැර පියව" යි කිය එසේ දොර නොහරනා හෙයින් නම් සලකුණු කියනුයේ "එම්බල! මම හරන්තිකයාය.මාගේ කටහඬිනුත් දැනගත නොහැකිද? දොර හැර පියව" යි කී ය. එසේ කීවද ඔහුගේ භාර්යාතොම භයින් තැතිගෙන පිට මළ මිනියකුත් බැඳගෙන ආ හෙයින් සැබැවින් ම යක්ෂයෙකැයි සිතා බැ'ණ නොනැඟී සැඟවී ගියා ය. එකල සොරා නොයෙක් කාරණා කියාත් ගිවිස්වා දොර අරවාගත නොහී එසේ ම තමන්ගේ දෙමාපියන්ගේ ද සෙසු නෑයන් හා කුසෙහි ඔත්තවුන්ගේ ද යහළු මිත්‍රාදීන්ගේ ද ගෙවලට වෙන වෙන ම ගොස් එක තැනෙකත් දොර හරවාගත නුහුණුයේ ම ය. ඔහු ගිය ගිය තැන්හිම මනුෂ්‍යයෝ සැබවින්ම යක්ෂයෙක් ආයේ යයි සිතා භයින් දොර නොහැරියාහු ම ය. මෙසේ ඒ සොරා ගම මුළුල්ලෙහි ඇවිද එක තැනෙකත් පිටිවහලක් නොලැබ තෙරුන් වහන්සේගේ සමීපයටම යෙමි යි සිතා විහාරයට ම ගොස් "ස්වාමීනි! ගැත්තවුන්ට පිටිවහල් වුව මැනව. මේ පිට බැඳි මළ මිනිය උනා හැර මා සුවපත් කළ මැනවැයි කීය. තෙරුන් වහන්සේ ඔහු දැක කම්පාව උපිරුණු ශෝක ඇතිව වහා හුනස්නෙන් නැඟී ඔහු සමීපයට එළඹ පිට බැඳි මල මිනිය උනාගෙන ගොස් දුර දමා ඔහු උණු පැනින් නහවා කුලාවෙන් තෙල් ගෙන සකල ශරීරය තෙල් ගල්වා මුගුරෙන් පහළ තැන් සවමින් උන්කල්හි.

www.artsapi.lk



Scanned by CamScanner

I උපාසකයාගේ උපදෙස් ලද ගමවැසියන් කළේ කුමක්ද?

II' සොරාගේ භාර්යාව කිහු සැබෑ යක්ෂයකුයැයි සිතුවේ ඇයි?

III' භාර්යාවගෙන් දොර අරවාගත නොහී කල්හි සොරා කළේ කුමක්ද?

IV' සොරා තෙරුන් වහන්සේගෙන් ඉල්ලා සිටි උදව්ව වන්නේ ?

(ආ) ගිමන නිවන සිසිලස තරග රොත් වැද
බමන මඟර රැවු සහ මල් සුවඳ හැද
හමන සිහිදු මඳ නල පහස විඳා විද
කමන නදන විසිතුරු තුරු සිරෙසා සිඳ

සිට ගඟ ඉවුරෙහි සෙද නොහැලියා
මන රඟ මල්වල මුක වරලියා
කොමළගපැනගෙන රඟ උදුලියා
වියොවගදද ලෙළ සිරි කියෙලියා

I හමන මඳනල විසින් ඇදගෙන එන්නේ මොනවාද?

II' ග්‍රීෂ්මය නිවෙන්නේ කුමක් නිසාද?

III' ලෙළ දෙන කොඩි වලට සමාන වන්නේ කුමක්ද?

IV' "කොමළඟ ,වියොවග " යන පදවල සරල අර්ථ ලියන්න.

(ඇ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

I "සෙසු වුවමනා දවස් තැති හෙයින් අදම වුවමනා ද?"

II' "මම උන්ට රාජ්‍යය නොදෙනු කැමැත්තෙමි"

III' "සොඳුරි රජ්ජුරුවන් වහන්සේ අද මේ මාලිගාවට වඩනා සේක්ල"

www.artsapi.lk

Scanned by CamScanner

IV' "සාත්තා ලැජ්ජයි යන්නේ නෑ කොහේවත්"

V' "ඔබ මොකද ඔය මාව හැල්ලු කරලා ඕනෑනෑකි කතා කියන්නේ ?"

VI' "එහෙනං ඔහොම ඉන්න ඕනෑ එළියට යන්නේ හෙම නෑ..."

(ඇ)

පහත දැක්වෙන කවි පෙළ පිළිබඳව රසාස්වාදයක් කරන්න.

ගෙදරින් පැන ඇවිත් ටික කලකට පස්සේ
දර වැඩපළක එදවස කුලියට බැස්සේ
ඔබ හමු වුණා - විමලේ, වාඩිය අස්සේ
තනිකම එදා නොදැනුණි මට ලඟු මැස්සේ

එදා සිටන් තරගෙට අපි දර පැලුවා
වනන්තෙරේ ඉර - හඳ දුක සැප බැලුවා
කැලෑ කොළේ ගණනට දාඩිය හැලුවා
බැද්දේ කුරුල්ලන් නොනිදා හඬ තැලුවා

හවසට වැඩ ඇරී අත් දෙක රිදුම දෙන
නාගෙන වතුර පොඩි වී නැති ගඟට පැන
රතු කොටු සරම වෙළෙන තුරු එකම තැන
ජීවිය උරමු දෙන්නා,වෙන සැප ද මොන

උඩහ කැලෙන් පෙරළීගෙන පුළඟ වැටෙයි
මහ රැවාඩියේ අපගේ නින්ද කොටයි
සමහර දාට එළි වන තුරු කතා වටයි
පොරෝ නලේ පිට සඳ රැස් බිංදු නටයි



www.artsapi.lk

Scanned by CamScanner

මහසඳ එදා දර පැලුවා පහළ    කැලේ
වැටුණා පොහොරාව විසි වී ගඟ හැරෙන    වලේ
මුදලාලිගේ බැනුමෙන් මා හැලෙන    වෙලේ
පැන්නේ ඔබයි කිමිදෙන්නට ගලන    ජලේ
හදිස්සියෙන් ඔබ වතුරෙන් උඩ    ආවා
අතකින් මුහුණ වහගෙන කෙඳිරිලි    ගෑවා
'ගඟ යට උලක් තළලේ වැදුණා'    කීවා
පිලි ගහන ලේ ඇසකින් විසි    වූවා

දරලොරියකින් හිස උකුලේ    තියාගෙන
ආවා වීදියට රෝහල    සොයාගෙන
මගේ කොටු සරම රතු විය ලේ    උරාගෙන
තුඹ තැඩුවේ කොහොමද දුක    දරාගෙන

මා වෙනුවෙන් එදා ගඟ පතුලේ    කිමිද
ඔබ හිස ගසාගත්තේ පොළවේ    කිමද
-විමලේ මමත් ඔබේ දුක් දහරේ    කිමිද
දිවි ඇති තුරා එම් ඔබ පසුපස    සබඳ

(2). සද්ධර්මරත්නාවලියේ කථා වස්තු උගත් සියලු දෙනාට එකසේ රසවිඳිය හැකි සර්වකාලීන අදහස්වලින් සමන්විතය. නියමිත කථාවස්තු ඇසුරෙන් මේ අදහස විමසන්න.



www.artsapi.lk
Scanned by CamScanner

නැතහොත් ,

අද්භූත කථා සම්ප්‍රදාය තුළ රස වින්දනයට හානියක් නොවනසේ කථාන්තර ඉදිරිපත්කිරීම ජාතක කථාකරුවාගේ විශේෂත්වය විය. නියමිත ජාතක කථා ඇසුරෙන් පහදන්න.

(3). ඓතිහාසික බණකතා රචනා කිරීම හේතුවෙන් සාලිත සමාජ තොරතුරු සද්ධර්මාලංකාරයෙන් හෙළිකරගත හැකිය.නියමිත කථාවස්තු ආශ්‍රයෙන් විමර්ශනයක යෙදෙන්න

(4). ගිරා සන්දේශය තුළ කිසියම් නව්‍යතාවයක්දක්නට ලැබෙන්නේ කවියා තුළ පැවති ප්‍රතිභාපූර්ණ හා පරිණත කවිත්වය නිසාය.වර්ණනා තුනක්වත් ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න.

(5) මළගිය ඇත්තෝ නවකතාව, සමාජගත ස්ත්‍රී පුරුෂ විවිධාකාරවූ ජීවිත පිළිබඳ සැඟවුණු ඇතැම් කාරණා ඉස්මතු කිරීමට ගන්නා වූ වෑයමකි " විමසන්න.

(6)' මාපිය සෙනෙහස හිමිවීම හා එතු අහිමිවීම මත දරුවන්ගේ ජීවිතවල ඇතිවන අර්ථය හා අනර්ථය මතු කිරීමට නූතන කෙටිකතා කරුවන් පෙන්වූ උනන්දුව කෙටිකතා තුනක්වත් ආශ්‍රය කොටගෙන සාකච්ඡා කරන්න.

(7)' නූතන කවිහු ශ්‍රව්‍ය ගෝචර ස්වරූපයට සීමා නොවී දෘෂ්ටි ගෝචර ස්වදෙපයක්ද මනසට නැංවීමට උත්සහ ගතිති නියමිත පද්‍ය පන්ති තුනක්වත් නිදසුන් කොට දක්වමින් පහදන්න.

(8) "කිසිවකු හට අබිමන දෑ ඉරණම

අනුවම සිදුවෙයි කොද සැකයක් එහි "

රත්නාවලී නාට්‍යය ගොඩනැගී ඇත්තේ ඉහතකි ප්‍රකාශය පදනම් කොට ගෙනය මෙම කියමන නිදසුන් ඇසුරෙන් විභාග කරන්න.



www.arisapi.lk

Scanned by CamScanner